# සිංහල ජාතියේ සම්භවය

මහාවිහාරික භික්ෂූන් වහන්සේලා විසින් කරන ලද කාර්යභාරය පිළිබඳ ව අපි දිගින් දිගට ම කතාකර ඇත්තෙමු. හතරවැනි පස්වැනි සියවස්වල උන්වහන්සේ එක් පැත්තකින් කර ඇත්තේ ආන්ද්‍ර ප්‍රදේශයෙන් ථෙරවාද බුද්දහම නැතිවෙන අයුරුත් ඒ මහායානයටත් ඉන්පසු වෛදික ආගමටත් (පසුව හින්දු වූ) පරිවර්තනය වනු දැක ලංකාවේ ථෙරවාදය ආරක්ෂාකිරීමට පියවර ගැනීම ය. එහි දී උන්වහන්සේ ආන්ද්‍රයෙන් වැඩමකළ බුද්ධඝෝෂ හා බුද්ධදත්ත ආදී හිමිවරුන් සමග එකතු වී ධර්මය පාලියෙන් ලියා තැබීමට පියවර ගෙන ඇත. අනෙක් පැත්තෙන් උන්වහන්සේ කර ඇත්තේ දක්ෂිණ භාරතයේ එකල නැගී ආ දෙමළ බලය ලංකාවේ පැතිරයෑම වැළැක්වීම සඳහා සුදුසු ක්‍රියා මාර්ගයක් අනුදැන වැදෑරීම ය. මේ අංශ දෙකම එකතු කෙරී ඇත්තේ ථෙරවාද බුද්දහම රැකීම සිංහලයන්ගේ කාර්යභාරය බවට පත්කරමිනි. ගැමුණු කුමරු මේ සම්බන්ධයෙන් ප්‍රායෝගික ව යම් ක්‍රියා මාර්ගයක් ගන්නට ඇත. එතුමාගේ සුප්‍රසිද්ධ ප්‍රකාශයක් වූ මාගේ මේ ව්‍යායාමය හුදෙක් රජසැප පිණිස නොව බුද්ධ ශසනයේ චිරස්ථිතිය සඳහාය යන්න සිංහලයන්ගේ ජාතියේ මතවාදය හා කාර්යභාරය බවට පත්කරන්නට ඇත්තේ මහාවිහාරික භික්ෂූන් වහන්සේ ය.

ඒ හතරවැනි පස්වැනි සියවස්වල සිද්දවන්නට ඇත. එහි දී උන්වහන්සේට ජනප්‍රවාදයේ පැවති අදහස් ද ආධාර වූවාට සැකයක් තිබිය හැකි නො වෙයි. සිංහලයන්ගේ කාර්යභාරය බුදුසසුන රැකීම බවට පත්වූවාට පසු සිංහලයන් ආක්‍රමණිකයන් හා සටන් කෙළේ හුදෙක් රටේ ස්වෛරීභාවය රැකීමට පමණක් නොව ථෙරවාද වුද්දහම ද රැකගැනීම සඳහා ය. බෞද්ධ විදේශිකයෝ ලංකාව ආක්‍රමණය නො කළහ. ලංකාව ආක්‍රමණය කළෝ අබෞද්ධ විදේශිකයෝ ය. එබැවින් ථෙරවාද බුද්දහම රැකීම හා රටෙහි ස්වෛරිභාවය රැකීම යනු දෙකක් නොව එකක් ම බවට පත්විය.

අපේ මුළු ඉතිහාසය ම විකාශය වී ඇත්තේ මේ කරුණ වටා ය. 1815 දී අත්සන් කරන ලද සිංහල බ්‍රිතානි ගිවිසුමට ද බ්‍රිතානීන් බුද්දහම රැකිය යුතු ය පෝෂණය කළ යුතු ය යනුවෙන් වගන්තියක් ඇතුල් වී ඇත්තේ සිංහලයන්ගේ සිත්වල (ඇඟෙහි) මේ කරුණ පැලපදියම් වී ඇති බැවිනි. ඒ වගන්තියට එකඟවීමට බ්‍රිතානීන්ට බලකිරීම සුළුපටු කරුණක් ලෙස නොසිතිය යුතු ය.  එපමණක් නොවෙයි. 1972 ජනරජ ව්‍යවස්ථාවේ ද ඉන්පසු 1978 ව්‍යවස්ථාවෙහි ද මේ සඳහන් වී ඇත්තේ මහාවිහාරික භික්ෂූන් වහන්සේ හතරවැනි පස්වැනි සියවස්වල ගත් පියවර හේතුකොට ගෙන ය. අපේ ස්වෛරිභාවය ඇත්තේ මෙහි ය. සිංහල ජාතිකත්වයේ පදනමේ ඇත්තේ ථෙරවාද බුද්දහම රැකීම ය. අද බටහිරයන් හා රාජ්‍ය නොවන පඬියන් ඊනියා මානව අයිතිවාසිකම් බහු සංස්කෘතික බහු ජනවාර්ගික කතා ඔස්සේ මේ වගන්තිය ව්‍යවස්ථාවෙන් ඉවත්කිරීමට කැසකවන්නේ ද  ඒ හේතුවෙනි. ඒ ඉවත් කළහොත් අපේ ස්වෛරිභාවය ටික කලෙකින් ම නැති වී යනු ඇත. සර්වපාක්ෂික නියෝජිත කමිටුව ද මේ වගන්තිය පිළිගැනීමට එකඟවීම වත්මන් අපේ පමණක් නොව මහාවිහාරයේ ද ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි ය.

එහෙත් මේ මතවාදයෙහි, එනම් ථෙරවාද බුදදහම රැකගැනීම සිංහලයාගේ කාර්යභාරය වේය යන්නෙහි, වැදගත්කම තේරුම් ගැනීමට නොහැකි වූවෝ මෙරට සිටියහ. බ්‍රිතානීන් විසින් මහාවිහාරයට එරෙහිව ගෙනගිය මතවාදවලින් නොමග ගිය අවංක බුද්ධිමත්තු ද ඒ අතර වූහ. බ්‍රිතානීන්ට පෙර යක්ෂ ගෝත්‍රයට සම්බන්ධ අය ද මහාවිහාරයට විරුද්ධ වී ඇත. අප කලින් සඳහන්කර ඇති පරිදි මහාවිහාරයට ඊනියා විදේශික, විශේෂයෙන් ම තකුණු භාරතීය, ගැති බවක් ආරූඪ කිරීමට උත්සාහ ගත්තෝ වෙති. පඬුඅබා (අබා නොව) රජු යක්ෂ ගෝත්‍රිකයන් ද එක්කරමින් සිංහල ජාතිය ගොඩනැගුව ද ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් එයට විරුද්ධ වී ඇත. ඔවුන්ගේ විරුද්ධතාව සියවස් ගණනාවක් පැවති බව ද පෙනී යයි. ඔවුන්ගෙන් ඇතැමකු අනෙක් සිංහලයන් සමග ආවාහ විවාහ නොවී සිටින්නට ද ඇත. ඇතැමුන් වෙනත් අය සමග විවාහවීමෙන් පසුව පරම්පරාවකින් හෝ දෙකකින් හෝ සිංහල වන්නට ඇත.

එහෙත් අප මෙහි දී සාකච්ඡා කරන්නේ එලෙස සිංහල වීම නො වේ. අද වන විට යක්ෂ ගෝත්‍රිකයන් යැයි කිවහැකි අයකු ඇත්නම් ඒ ඉතා අල්ප පිරිසකි. එහෙත් ගැමුණු රජ දවස පමණක් නොව මහසෙන් රජු දවස ද යක්ෂ ගෝත්‍රිකයන් යැයි කිවහැකි යම් පිරිසක් මෙරට සිටි බව පැහැදිලි ය. ඔවුන් සිංහලයන්ට හා සිංහලයන්ගේ ස්වෛරීභාවය ආරක්ෂාකිරීමට මගපෙන්වූ අනුශාසනා කළ මහාවිහාරික භික්ෂූන් වහන්සේට විරුද්ධව කටයුතු කර ඇතැයි සිතිය හැකි ය. මහාවිහාරික භික්ෂූන් වහන්සේ දක්ෂිණ භාරතයට ගැතිකම් කෙළේ යැයි කීව ද, මහාවිහාරයට විරුද්ධව මහසෙන්

© Prof. Nalin De Silva

රජු යොදාගනු ලැබුයේ සංඝමිත්‍රා නම් සොළී භික්ෂුව විසිනි. මහාවිහාරය දක්ෂිණ භාරතයට ගැතිකම් කෙළේ නම් එවැන්නක් සිදුවිය හැකි ද? යක්ෂයන් මහසෙන් රජුට උපකාර කෙළේ යැයි කියැවෙයි. එසේ කෙළේ නම් ඒ පුදුමයක් නො වෙයි. යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් යම් පිරිසක් බුදුදහම සමග දිගින් දිගට ම ප්‍රශ්න ඇතිකර ගත්තාට සැකයක් නැත. මා සිතන අයුරින් නම් එසේ වීමට ප්‍රධාන හේතුව යක්ෂ ගෝත්‍රිකයන්ගේ චින්තනය හා සංස්කෘතිය සිංහල ජාතියේ චින්තනය හා සංස්කෘතිය සමග නො පෑහීම ය. යක්ෂ ගෝත්‍රිකයෝ මළ නෑ යකුන් ඇදහූහ. යක්ෂ ගෝත්‍රිකයන් ද බ්‍රාහ්මණයන් මෙන් ම ආත්මවාදීන් වන්නට ඇත. එබැවින් යක්ෂයන් ද බ්‍රාහ්මණයන් මෙන් ම පොදුවේ ගත්කල අනාත්මවාදයට විරුද්ධවීමට ඇති ඉඩකඩ ඉතා වැඩි ය.

දහනවවැනි සියවස අවසාන වන විට සිංහල ජාතියෙහි දුර්වල තැන් ගැන අවබෝධයක් බ්‍රිතාන්‍යන්ට තිබෙන්නට ඇත. සිංහල ජාතිය දුර්වල කිරීමට අවශ්‍ය නම් ඇතුළතින් සිට එසේ කිරීම පහසු ය. පසුගිය දශක කිහිපයක සිදුවන්නේ එයයි. කෙසේ වෙතත් මහාවිහාරය දක්ෂිණ භාරතයට පක්ෂ වී යැයි ද, මහාවිහාරය අපේ භාෂාව නැතිකිරීමට කටයුතු කෙළේ යැයි ද, එකල තැනින් තැන පැතිරෙන්නට විය. මේ මතය තහවුරු කිරීමට තිබුණේ එකම එක සාධකයක් පමණකි. ඒ ධර්මය අඩංගු පොත පත පාලි භාෂාවට පෙරළීමත් දක්ෂිණ භාරතයෙන් වැඩම කළ බුද්ධඝෝෂ හිමියන් එයට උපකාර කිරීමත් ය. ඒ හැරෙන්නට අනෙක් සියල්ලකින් ම කියැවුණේ මහාවිහාරය සිංහල බුද්ධාගමේ උන්නතියට කටයුතු කළ අයුරු ය.

එහෙත් ටික කලකට පෙර වරුණ චන්ද්‍රකීර්ති මහතා පොත් පාලියට පෙරළීම පිළිබඳ ව නව මතයක් ඉදිරිපත් කරමින් කියා සිටියේ ධර්මය කතා ව්‍යවහාරයෙහි නොපවතින භාෂාවක් වූ පාලියෙන් ලියා තැබීමෙන් ඒ ආරක්ෂා වූ බව ය. සිංහලයෙන් ධර්මය තිබිණි නම් වෙනස් කිරීමට, නව අර්ථකථන දීමට, ඇති ප්‍රවණතාව වැඩි බව අමුතුවෙන් කිවයුතු නො වේ. මේ මතය වර්ධනය කිරීමෙහි ලා ඇසිය යුතු පළමු ප්‍රශ්නය වූයේ එසේ ථෙරවාද බුදුදහම ආරක්ෂා කිරීමට විශේෂ හේතුවක් වී ද යන්න ය.

අද මේ මතය වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස හතරවැනි පස්වැනි සියවස්වල ආන්ද්‍ර ප්‍රදේශයෙන් බුදුදහම නැතිවීම හා දක්ෂිණ භාරතයේ දෙමළ බලය වැඩිවීම හේතුවෙන් මෙරට ස්වෛරීභාවය ආරක්ෂා කිරීමටත් ථෙරවාද බුදුදහම ආරක්ෂා කිරීමටත් මහාවිහාරය කටයුතු කර ඇති බවත් එහි දී ආන්ද්‍ර ප්‍රදේශයේ බුද්ධඝෝෂ බුද්ධදත්ත ආදී භික්ෂූන් වහන්සේගේ සහායෙන් දහම් පොත් පාලි භාෂාවට පෙරලා ඇති බවත් කීමට අපට හැකි විය. එමෙන් ම ථෙරවාදී බුදුදහම ආරක්ෂා කිරීම හේතුවෙන් දැනුම් සම්බන්ධ අපේ ආකල්පය නිර්මාණයෙන් ආරක්ෂාකිරීමට පරිවර්තනය වූ බවත් අප ඉන්පසු, එනම් පස්වැනි සියවසෙන් පමණ පසු දැනුමක් නිර්මාණය කර නොමැති බවත් පැහැදිලි විය. මේ මතය මහාවිහාරයේ අනෙක් කටයුතුත් සමග සංගතවීම අපට ධෛර්ය ගෙන දෙන්නක් විය. අප දැන් යක්ෂ ගෝත්‍රිකයන් ගැන කියන කතාවද, එනම් ඔවුන් ගැන වූ ප්‍රවාදය ද අනෙක් සියල්ල සමග සංගත වෙයි.

එහෙත් විසිවැනි සියවසේ මේ දැනුම මෙරට කිසිවකුට නොවී යැයි සිතිය හැකි ය. එහි ප්‍රතිඵලය වූයේ අනෙක් කරුණු සමග අසංගත වුවත්, දහම් පොත් පාලි භාෂාවට පරිවර්තනය කිරීම වටා මහාවිහාරයට විරුද්ධව මතයක් ගොඩ නැගීමට ඇතැමුනට හැකිවීම ය. මහාවිහාරය විදේශිකයන්ට ගැතිකම් කළ බවත් අභයගිරිය දේශීය භික්ෂූන් වහන්සේගේ මධ්‍යස්ථානය වූ බවටත් ඒ සමග මතයක් ගොඩනැගිණි. යක්ෂ ගෝත්‍රිකයන් ස්වදේශිකයන් බව ද විදේශයෙන් පැමිණි සිංහ වාංශිකයන් (ගෝත්‍රිකයන්) යුද්ධයෙන් හා වෙනත් ක්‍රමවලින් යක්ෂ ගෝත්‍රිකයන් පරාජය කර ආධිපත්‍යයක් ගොඩ නැගූ බව ද කලක් තිස්සේ මහාවංසය ඇසුරෙන් පිළිගැණිනි. අප සිංහලයන් ලෙසින් නම් කෙරුණේ විජය කුමරුගේ සිංහ වංශය නිසා බව ද ඒ සමග කියැවිණි. එය ද මහාවිහාරයට විරුද්ධව පසුව යොදා ගැණිනි. මහාවිහාරය ස්වදේශිකයන්ට නොව විදේශිකයන්ට පක්ෂපාත බව එයින් ද තහවුරු වුණු බව ඇතැමුන්ගේ මතය විය.

මහාවංසය ලියා ඇත්තේ ම විදේශික සිංහ වංසය හෙවත් විජය කුමරු සමග පැමිණි පිරිස ඔසොවා තබා සවදේශික යක්ෂ ගෝත්‍රිකයන් පහතට දැමීමට බව ඇතැමුන්ගේ මතය විය. එහෙත් නාගයන් එසේ පහතට දමා නැත්තේ ඇයි දැයි ඔවුහු නො ඇසූහ. සිංහල ජාතිය ගොඩනැගුණේ විජය කුමරු සමග පැමිණි පිරිසෙන් ය යන්න මහාවංසයෙන් ඉදිරිපත් කෙරුණු මතය විය. රටේ සාමාන්‍යයෙන් පිළිගත් මතය ඒ විය. එහෙත් ඒ නිවැරදි නොවන බව අමුතුවෙන් කිවයුතු

© Prof. Nalin De Silva

නො වෙයි. සිංහල ජාතිය නිර්මාණය වී ඇත්තේ කෙසේ ද යන්න පිළිබඳ ව විකල්ප මත දෙකක් පසුගිය සියවසේ ප්‍රචලිත ව තිබුණි.

ඒ මත දෙකින් ම කියැවුණේ විජය කුමරු මෙරටට පැමිණෙන විට සිටි ගෝත්‍රවල එකතුවකින් සිංහල ජාතිය ගොඩනැගුණු බව ය. එහි දී විජය කුමරු සමග පැමිණි පිරිසෙන් සිංහල ජාතියට කිසිවකු එකතු නොවූ බව මත දෙකින් ම පොදුවේ කියැවිණි. මත දෙක එකිනෙකින් වෙනස් වූයේ සිංහල ජාතිය ගොඩනැගීමෙන් පසු සිංහ වංශයට කුමක් විණි ද යන්න සම්බන්ධව ය. එක් මතයකින් ඒ පිළිබඳ කිසිවක් නො කියැවිණි. අනෙක් මතයෙන් කියැවුණේ සිංහල ජාතිය ගොඩනැගුණේ සිංහයන් ඝාතනය කිරීමෙන් පසුව බව ය. පළමු මතයට අනුව සිංහල ජාතියට ඒ නම ලැබුණේ සිංහ වංසයක් නිසා නොව හෙළ ගෝත්‍ර හතරක්, එනම් යක්ෂ, රාක්ෂස, දේව, නාග යන ගෝත්‍ර එකතුවීම නිසා ය. සිව් හෙළ ගෝත්‍ර යන්න සිව්හෙළ බවටත් පසුව සිංහල බවටත් පත් වී ඇත යනුවෙන් මතවාදය වර්ධනය විය. අනෙක් මතයට අනුව සිංහයන් ඝාතනය කෙරුණු බැවින්, එනම් සිංහයන් ලානය කෙරුණු බැවින් එසේ සිංහයන් ලානය කිරීමෙන් බිහිවූ ජාතිය සිංහල විය. එහෙත් මේ මත දෙකම කෘත්‍රිම වූ අතර එයට පොදු වූ තවත් කරුණක් ද විය. ඒ මත දෙකින් ම කියැවුණේ සිංහල ජාතිය නිර්මාණය කෙරුණේ පඬුඅබා රජු අතින් බව ය. පඬුඅබා විදේශික ආක්‍රමණිකයන් වූ සිංහයන් පරාජය කර දේශයේ නිදහස දිනාගත් වීරයකු ලෙස බෞතීස්ම කිරීමේ වෑයමක් ද ඇතැම් මාක්ස්වාදීන්ට හා වෙනත් විජාතික උගතුන්ට වෙයි. එහෙත් මොවුන්ට තේරුම් කිරීමට නොහැකි දෙයක් ඇත. එනම් සිංහයන් වර්ගයක් හෝ ගෝත්‍රයක් හෝ වංසයක් හෝ ලෙස පරාජය කර ගොඩනැගූ ජාතියක් සිංහ නමින් සිංහල වූයේ කෙසේ ද යන්න ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva